රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.
කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 25 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 11 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 21(ඉ) වගන්තිය අනුව අදාල ආයතනයේ අයවැයගත දත්ත සමඟ සත්‍ය දත්ත මූල්‍ය ප්‍රකාශනවල ලෙස ඉදිරිපත් කලයුතු වුවත්, එසේ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ප්‍රමිතියේ 21(ඈ) වගන්තිය අනුව හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුලත්ව තිබූ, සමාලෝචිත වර්ෂය තුල ත්‍යාග වශයෙන් ලද රු. 25,000 ක් වූ පෙතංගොඩ පිහිටි පින්නගොල්ල හේන නැමැති ඉඩම හා අක්කර 16 පර්චස් 07 ක් වූ වෙනත් ඉඩම් කොටස් 10 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම් වලට අදාල කාර්ය මණ්ඩල දීමනාව රු. 187,996 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ට අයත් වාහන 04 ක වටිනාකම වූ රු. 5,548,000 ක් මෝටර් රථ හා කරත්ත යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.3.3 නොසැසඳුන පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 06 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 30,669,947 ක් වූ අතර, උපයෝගී ලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 29,065,709 ක් වූ අතර වෙනස රු. 2,838,128 ක් විය.

1.3.4 අවිනිශ්චිත ගිණුම්

2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 18,981 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 <u>ගෙවිය යුතු ගිණුම්</u>

2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 9,752,094 ක් විය.

1.3.6 <u>නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.</u>

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා වලට යොමුව | අනුකූල නොවීම් කළමනාකරණ තීරණ |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මු.රෙ. 570 (ඇ), 571 හා 572 වගන්ති | 2005 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා රු. 2,027,034 ක් වූ තැන්පත් සම්බන්ධයෙන් විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) | සබරගමුව පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය | |
| | 261.2.2 රීතිය | අවස්ථා 03 කදී ලබාදුන් රු. 656,091 ක් වූ අත්තිකාරම් මුදල් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

02. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 1,247,946 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,360,432 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 2,608,378 ක පිරිහීමක් පෙන්විය.

2.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම්, දඩ හා වරෙන්තු හා කුලී ආදායම අඩුවීමත්, වැටුප් හා දීමනා, සැපයුම් හා උපකරණ, ප්‍රවාහන සම්බන්ධතා, අවශ්‍යතා හා සේවා වියදම් වැඩිවීමත් මූල්‍ය ප්‍රතිඵලයේ ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.3 <u>ආදායම් පරිපාලනය</u>

2.3.1 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2013 දෙසැම්බර්31දිනට -න්තුගත | | ඇස්තමේ- සමුච්චිත | තථ්‍ය හිඟය |
|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | |
| (i) වරිපනම් හා බදු | 3,256 | 2,828 | 428 | |
| (ii) බදු කුලී | 10,185 | 8,187 | 1,998 | |
| (iii) බලපත්‍ර ගාස්තු | 846 | 339 | 507 | |
| (iv) වෙනත් ආදායම් | 16,200 | 15,616 | 584 | |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ මුදල් රු. 5,759,926ක් වූ අතර,ලැබිය යුතු මුද්දර ගාස්තු ඇස්තමේන්තු කර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 6,756,035 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂ වල එකතුව රු. 361,184 ක් විය.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතියේ මූල්‍යාධාර මත සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමණාකරන ව්‍යාපෘතියේ ඉදි කිරීම් සඳහා ඉඳුරාන එක්සත් ගොවි සංවිධානය සමඟ රු. 1,904,007 ක කොන්ත්‍රාත් ගිවිසුමකට 2013 මාර්තු 15 දින එළඹ තිබුණි.

එම කර්මාන්තයේ ගෙවීම් වාර්තාවේ වැඩ විෂය අංක 19 යටතේ ගොඩනැගිල්ලේ වහලයේ වැහිපිහිලි හා වතුර බැස යන බට අමානෝ තහඩු යොදා සකස් කර සවි කිරීම වෙනුවෙන් එකතුව දික් අඩි 463.68 ක් සඳහා රු. 122,875 ක මුදලක් ගෙවා තිබුණද, වැහිපිහිලි එකතුව දික් අඩි 51.66 ක් හා වතුර බැස යන බට දික් අඩි 308.02 ක් සවි නොකර ඒ සඳහා රු. 95,315 ක මුදලක් ඉටු නොකළ වැඩ වෙනුවෙන් ගෙවා තිබුණි.

04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 පිළිතුරු නොදුන් විගණන විමසුම්

2014 මාර්තු 31 දින වන විට විගණන විමසුම් 08 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම් වලට භාජනය වූ ගණුදෙනු වල ගණනය කල හැකි වටිනාකම රු. 4,323,107 ක් විය.

4.2 අභ්‍යන්තර විගණනය

1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

05. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය
(ආ) ණයගැති පාලනය
(ඇ) ණයහිමි පාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය